tamil rights group

7 Eastvale Drive, Suite 207
Markham, Ontario L3S 4N8, Canada
info@tamilrightsgroup.org | + 1 (647) 833-2674

**වහාම නිදහස් කිරීම සඳහා**
නොවැම්බර් 9 2021

# ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ඊළම් දෙමළ ජනතාවට යුක්තිය පතා, දෙමළ අයිතිවාසිකම් කණ්ඩායම කැනේඩියානු ව්‍යාපාරයක් අරඹයි

**මාක්කම්, කැනඩාව -** ඊළම් දෙමළ ජනයාට යුක්තිය සහ, ශ්‍රී ලංකාවේ දණ්ඩමුක්තියට එරෙහිව සටන් කිරීම සහ,රෝම ප්‍රඥප්තිය අනුමත කළ රාජ්‍ය පාර්ශවයන් බල ප්‍රදේශ තුළ, ඊළම් දෙමළ ජනයාට එරෙහිව සිදු කරන ලද, පිටුවහල් කිරීම සහ හිංසා කිරීම වැනි මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ පිළිබඳ මූලික පරීක්ෂණයක් ඉල්ලා සිටින,ප්‍රධාන ජාත්‍යන්තර ක්‍රියාමාර්ගයක් ලෙස, දෙමළ අයිතිවාසිකම් කණ්ඩායම (TRG),රෝම ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ (ICC) අභිචෝදක කාර්යාලයට සන්නිවේදනයක් ඉදිරිපත් කර ඇත.

මානව වර්ගයාට එරෙහි අපරාධ සහ යුද අපරාධවලට සමාන සාහසික ක්‍රියාවලට, විශේෂයෙන්ම දිගු කලක් පැවති, 2009 දී අවසන් වූ , සිවිල් යුද්ධයේ අවසන් අදියරේ දී ශ්‍රී ලංකාවේ ඊළම් දෙමළ ජනතාව ගොදුරු වූ බවට වැඩි සාක්ෂි තිබේ.

දේශීය අධිකරණ ආයතන තුළ එවැනි අපරාධ විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට ඇති අකමැත්ත ශ්‍රී ලංකා රාජ්‍යයේ අඛණ්ඩ ක්‍රියාවලින් ඔප්පු වී ඇති බව පිළිගනිමින්, විදේශ, දේශීය උසාවිවල නඩු පැවරීම ආරම්භ කිරීම සඳහා විශ්වීය අධිකරණ බලයේ මූලධර්මය භාවිතා කිරීම සහ ජාත්‍යන්තර මට්ටමින් යුක්තිය පසිඳලීම සඳහා පියවර ගැනීම වැනි දෙමාර්ගයෙන්, ශ්‍රී ලංකා සන්නද්ධ ගැටුමෙ අවට තිබි දණ්ඩමුක්තිය අවසන් කිරීම සඳහා, කටයුතු කිරීමට සම්බන්ධ වන ලෙස, සාමාජික රටවල් වලින්, 2021 ජනවාරි මාසයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්,ඉල්ලා සිටියේය.

ශ්‍රී ලංකාව රෝම ප්‍රඥප්තියට රාජ්‍ය පාර්ශවයක් නොවන අතර, ශ්‍රී ලංකා රජයේ සහ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් ඇතුළු විවිධ ක්‍රියාකාරීන් බලහත්කාර ක්‍රියාවන් හරහා පිටුවහල් කිරීම සහ හිංසා කිරීම වැනි මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සිදු කළ බවට ප්‍රබල සාක්ෂි තිබේ.

මෙම අපරාධවලින් කොටසක් රෝම ප්‍රඥප්තිය අනුමත කළ රාජ්‍ය පාර්ශවයන් වන කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජර්මනිය, ප්‍රංශය, ස්විට්සර්ලන්තය සහ එක්සත් රාජධානිය ඇතුළු රටවල් ගේ භූමි ප්‍රදේශවල සිදු විය. පසුගිය වසර පුරා ජාත්‍යන්තර දෙමළ සරණාගත ආධාර ජාලය විසින් සම-කර්තෘ, සන්නිවේදනය තවදුරටත් තර්ක කරන්නේ, මියන්මාරය/බංග්ලාදේශය නඩුව මගින් ඇති කරන ලද පූර්වාදර්ශය මත, ශ්‍රී ලංකා නිලධාරීන් විසින්, සිදු කරන ලදී පිටුවහල් කිරීම සහ හිංසා පීඩා කිරීමේ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, විමර්ශනය කිරීමට, අධිකරණයට, අධිකරණ බලය තිබිය යුතු බවයි.

"ශ්‍රී ලංකාව මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රථම වරට උත්සාහ කිරීම ආරම්භ කර වසර දොළහක් ගතවී ඇත. එතැන් සිට,සාමාන්‍යයෙන් රට තුළ සිවිල් සමාජය සඳහා ඇති අවකාශය භයානක වේගයකින් හැකිලෙන විට පවා, ශ්‍රී ලංකා දූපතේ ඊළම් දෙමළ ජන සංහාරය නොනැවතී අඛණ්ඩව සිදු වූයේ."

වත්මන් පාලනය 2015 දී රාජ්‍යය විසින්ම සම අනුග්‍රහය දැක්වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවලින් ඒකපාර්ශ්විකව ඉවත් වූවා පමණක් නොව, ඕනෑම දේශීය හෝ ජාත්‍යන්තර වගවීමේ යාන්ත්‍රණයකින් සන්නද්ධ හමුදාවන් ආරක්ෂා කරන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ප්‍රසිද්ධියේ ප්‍රතිඥා දී ඇත.

එවැනි පසුබිමක් තුළ, දෙමළ අයිතිවාසිකම් කණ්ඩායමට සහ අනෙකුත් අයට ඇත්තේ අල්ප පිළිසරණකි. නමුත් නිර්දය ලෙස විශ්වීය අධිකරණ බලය සහ නීතිය හරහා සංක්‍රාන්ති යුක්තිය සෙවීමට, මෙම අවස්ථාවේ දී ඇත්තේ විශේෂයෙන්, ජාත්‍යන්තර අපරාධ අධිකර්නයයි.” **- කැට්පනා නාගේන්ද්‍රා, දෙමළ අයිතිවාසිකම් කණ්ඩායමේ ලේකම් සහ ප්‍රකාශක**

-30-

සියලුම මාධ්‍ය විමසීම් සඳහා
ජස්කරන් සන්දු
+ 1 647-990-8720
jaskaransandhu@statestrategy.ca